ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 228 - අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය නොවන වත්කම්වලට අදාළ SA-82 වගුවෙහි ගොඩනැගිලි හා නිලනිවාස තුළ 2024 වර්ෂයේ ගෙවූ රු.34,295,863ක වටිනාකම 2024 වර්ෂයේ කෙරීගෙන යන වැඩ - 9160හි ආරම්භක ශේෂය තුළ දක්වා තිබුණි.	SA-82 වගුවෙහි කාර්යාල ගොඩනැගිලි හා නිලනිවාස ශේෂයන්හි 2023 වර්ෂයේ අවසාන ශේෂය හා 2024 වර්ෂයේ ආරම්භක ශේෂය අතර, වෙනසට හේතු වී ඇත්තේ කේත අංක 9160 කෙරීගෙන යන වැඩ යටතේ ඇතුළත් වූ ව්‍යාපෘති ඉදිකිරීම් අවසන්ව ඇති බැවින්, එම වටිනාකම කෙරීගෙන යන වැඩ වටිනාකමෙන් ඉවත්කර, කේත අංක 9151 යටතේ කාර්යාල ගොඩනැගිලි හා නිලනිවාස ලෙස සිගාස් පද්ධතිය මගින් ගිණුම්ගතකරන බැවින්, වැඩ අවසන් කළ ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත් වී වත්කම් ලෙස ගිණුම්ගතකිරීමේ දී සිගාස් පද්ධතිය තුළ වත්කම්වල ආරම්භක ශේෂයට සිදුවන ගැළපීමක් බව දක්වා තිබුණි.	වර්ෂය තුළ දරන ලද වියදම් වර්ෂයට අදාළව ගිණුම්ගත කළ යුතු වේ.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වැය විෂයන් 03ක රු.1,844,770ක ප්‍රතිපාදන හා මූලධන වැය විෂයන් 05ක රු.16,243,815ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එය සියයට 16 සිට 70ක පරාසයක විහිදී තිබුණි.	අත්‍යාවශ්‍ය වියදම් පමණක් දැරීම අවශ්‍යතා ඇති නොවීම, මිලදීගැනීම් තාවකාලිකව අත්හිටුවීම, සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම යන හේතු මත ප්‍රතිපාදන ඉතිරි වූ බව දක්වා තිබුණි.	නිසිඅධ්‍යානයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය.
(ආ)	228-1-1-1-1503 රාජ්‍ය ආයතන වැය විෂය වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන්කර තිබූ රු.880,000ක් වූ මුළු පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයම සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරි වී තිබුණි.	කාර්යමණ්ඩල බඳවාගැනීමට සැලසුම් කළ ද, බඳවාගැනීම් ප්‍රමාද වීම හා වැඩි වූ ජීවන වියදම් දීමනාව ගෙවීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව ප්‍රතිපාදන ලබාදීම නිසා අමතර ප්‍රතිපාදන වියදම් නොවූ බව දක්වා තිබුණි.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන නිවැරදිව අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු ය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂයන් 11කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය රු.48,143,640ක් වුව ද, 2024 දෙසැම්බර් 31 දිනට රු.119,403,596ක බැරකම්වලට එළැඹ තිබුණි. ඒ අනුව, ප්‍රතිපාදන ඉක්මවා එළැඹ තිබූ බැරකම් වටිනාකම රු.71,259,955ක් විය.	උසාවිවල එදිනෙදා කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බැඳීම් ඇතිකර ගත් බව සහ මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් ද, අයවැය චක්‍රලේඛ මගින් වියදම් සීමාකිරීම් හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වූ බව දක්වා තිබුණි.	ලබාදී ඇති ප්‍රතිපාදන මත බැඳීම් කළමනාකරණයකර ගත යුතු ය.

3.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**		
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**			
	(i) මුදල් රෙගුලාසි 104	2022 හා 2023 වර්ෂවල දී අනතුරට පත් වාහන 02ක ද, සමාලෝචිත වර්ෂයේ අනතුරට පත් වාහන 09ක ද, පරීක්ෂණ මණ්ඩල අවසන් වාර්තා ලබා දී නොතිබුණි.	මුදල් රෙගුලාසි 104 අනුව විමර්ශන කටයුතු සිදුකර අවසන් වාර්තා එවීමට කටයුතු කරන ලෙස අධිකරණවලට දන්වා තිබුණි.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
	(ii) මුදල් රෙගුලාසි 396	2024 දෙසැම්බර් 31 දිනට මහාධිකරණ කලාප 10කට අයත් අධිකරණ බැංකු ගිණුම් 23ක මාස 06 ඉක්ම වූ රු.1,831,753ක චෙක්පත් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුවට අයත් වාහන 69ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	විනිසුරුවරුන් වෙත ලබා දී ඇති නිලරථවල වාර්ෂික ඉන්ධන දහන පරීක්ෂාව අදාළ මහාධිකරණය මගින් සිදුකිරීම වඩාත් ප්‍රායෝගික වන බැවින්, ඒ සඳහා අවශ්‍ය කටයුතු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 අනුව කඩිනමින් සිදුකර ඊට අදාළ වාර්තාවක් අමාත්‍යාංශය වෙත යොමුකරන මෙන් ලිඛිතව දැනුවත්කර ඇති බව දක්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.4 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රධාන කාර්යාලීය තැන්පතු ගිණුමෙහි පවතින ශේෂය රු.339,071,224ක් වන අතර, එහි කාලවිශ්ලේෂණය අනුව වසර 02කට වැඩි හා වසර 05කට අඩු කාලසීමාවක සිට පවතින තැන්පතු ශේෂය රු.240,234,146ක් ද, වසර 05කට වැඩි කාලයක සිට පවතින ශේෂය රු.42,597,090ක් ද, විය.	නිදහස් කිරීමට හැකියාව පවතින සියලු රැඳවුම් මුදල් නිදහස් කිරීමටත් එසේ නොවන්නේ නම් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි.	නිදහස්කළ හැකි තැන්පතු නියමිත පරිදි නිදහස් කිරීමට කටයුතු කළ යුතු වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට මහාධිකරණවල විසඳීමට තිබූ විවිධ වර්ගවල නඩු ප්‍රමාණය 16,393ක් වූ අතර, වර්ෂය තුළ දී නඩු 17,086ක් ගොනු වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළ දී විසඳීමට තිබූ 33,479ක් වූ මුළු නඩු ප්‍රමාණයෙන් 16,295ක් විසඳා තිබුණ ද, දෙසැම්බර් 31 දින වන විට නඩු 17,184ක් විසඳීමට තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී නඩු විසඳීමේ ප්‍රගතිය සියයට 48ක මට්ටමක පැවතුණි.	නීතියේ ප්‍රමාදයන් වැළැක්වීමට නීති ප්‍රතිසංස්කරණය, අධිකරණ ස්ථාපිත කිරීම, අධිකරණ නිලධාරින් සහ සහාය කාර්යමණ්ඩල බඳවාගැනීම සහ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයට සහාය දක්වන ආයතන ශක්තිමත් කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇති බව දක්වා තිබුණි.	නීතියේ ප්‍රමාදයන් වැළැක්වීමට පහසුකම් සලසා නඩු විසඳීමට කටයුතු සිදුකළ යුතු ය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දී විසඳීමට තිබූ මුළු කම්කරු ආරවුල් ප්‍රමාණය 5974ක් වන අතර, වර්ෂය තුළ දී ආරවුල් 2413ක් විසඳා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් දිනට විසඳීමට තිබූ ආරවුල් ප්‍රමාණය 3561ක් විය. සමාලෝචිත වර්ෂයේ කම්කරු ආරවුල් විසඳීම සියයට 40ක මට්ටමක පැවතුණි.	මේ සඳහා කාර්යමණ්ඩල හිඟය, භෞතික සම්පත් හා යටිතල පහසුකම්වල හිඟය හේතු වී ඇති බවත්, ඒවා කළමනාකරණය කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි.	කම්කරු ආරවුල් විසඳීම කාර්යක්ෂම හා කඩිනම් කිරීමට ක්‍රියාකළ යුතු ය.

4.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන මත ආරම්භකර තිබූ නව අධිකරණ සංකීර්ණ ඉදිකිරීම හා පුළුල්කිරීම්, නිලනිවාස ඉදිකිරීම් හා ලේඛනාගාර ඉදිකිරීම් ව්‍යාපෘති 32ක් අයහපත් ආර්ථික තත්ත්වය, අමුද්‍රව්‍ය මිල ඉහළයාම, මිල විචලන සීමා ඉක්මවීම වැනි හේතූන් මත කොන්ත්‍රාත්කරුවන් සමග අන්‍යොන්‍ය එකඟතාවය මත නතරකර තිබුණි. මෙම ව්‍යාපෘතීන් 32හි මුළු ඇස්තමේන්තුගත වටිනාකම රු.4,498,222,955ක් වන අතර, අවසන් කරන අවස්ථාව වන විට සමුච්චිත පිරිවැය රු.346,177,202 විය. මෙම ව්‍යාපෘති ඉටුකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 1 සිට සියයට 85ක මට්ටමක පැවතුණි.	විගණන නිරීක්ෂණයේ සඳහන් අන්‍යොන්‍ය එකඟතාවය මත නතර කරන ලද ව්‍යාපෘති අතරින් නවතා දමන අවස්ථාව වන විට භෞතික ප්‍රගතිය සියයට 50ක් ඉක්මවන ව්‍යාපෘති මෙම වසර තුළ දී යළි මිල ගණන් කැඳවා ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. අනෙකුත් ව්‍යාපෘති ඉදිරි අයවැයවල දී ප්‍රතිපාදන ලැබෙන පරිදි යළි ආරම්භ කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි.	ඉදිකිරීම් සැලසුම් කළ පරිදි අවසාන කර එහි අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු ය.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහනුවර අස්ගිරි ළමාගාර මාවතේ පිහිටි මහාධිකරණ විනිසුරු නිලනිවස නගර මධ්‍යයේ ඉතා ඉහළ වාණිජ වටිනාකමක් සහිත පර්චස් 40ක භූමි ප්‍රමාණයක පිහිටා තිබෙන අතර, මෙම නිලනිවස 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු කාර්යයකට භාවිතා නොකර වර්ෂ 05ක පමණ කාලයක් නිෂ්කාර්යව පැවතුණි.	2024 වර්ෂයේ අලුත්වැඩියා සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති අතර, අලුත්වැඩියා කටයුතු අවසන්වීමෙන් පසු විනිසුරු වෙත භාරදෙන බව දක්වා තිබුණි.	අලුත්වැඩියා කටයුතු කඩිනමින් නිමකර භාවිතය සඳහා අවස්ථා ලබාදිය යුතු ය.

(ආ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට තංගල්ල, බලපිටිය, හම්බන්තොට, හෝමාගම, ඇඹිලිපිටිය, කුරුණෑගල යන මහාධිකරණ පිහිටි අක්කර 4.86ක් වූ මුළු භූමි ප්‍රමාණය අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි.	බලපිටිය අධිකරණ භූමියේ ඉඩම ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලද වහාම ඉඩම් අමාත්‍යාංශය වෙත අත්සන් යෝජනාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්, බලපිටිය අධිකරණ සංකීර්ණය පිහිටි ඉඩම මිනින්දෝරු අධිකාරී වෙත මැනුම් ඉල්ලීම් සඳහා යොමුකර ඇති බවත්, හම්බන්තොට හා හෝමාගම අධිකරණ භූමි සම්බන්ධයෙන් අදාළ ප්‍රාදේශීය ලේකම්වරු වෙත දන්වා ඇති බවත්, ඇඹිලිපිටිය ඉඩම සඳහා මහවැලි අධිකාරිය වෙතින් ඉල්ලීම් කිරීමටත් කුරුණෑගල අධිකරණය ඉදිකිරීමට ඉඩම් හුවමාරු වැඩසටහනක් යටතේ ඉඩම් ලබාගැනීමට නියමිත බව දක්වා තිබුණි.	කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	අමාත්‍යාංශය විසින් 2000 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුළ නව අධිකරණ සංකීර්ණ ඉදිකිරීම හා පුළුල්කිරීම, නිලනිවාස ඉදිකිරීම් වැනි ව්‍යාපෘතීන් වෙනුවෙන් ලංකාවේ විවිධ ප්‍රදේශවලින් අක්කර 44ක් පමණ වූ ඉඩම් 25ක් අත්පත්කර ගැනීම ආරම්භකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට සැලකිය යුතු කාලයක් ගත වී ඇති නමුත්, එම ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.	වන්දි ගෙවීමෙන් අනතුරුව නීත්‍යානුකූලව පවරාගැනීම් සිදුකරන බව දක්වා තිබුණි.	කඩිනමින් එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතු ය.

4.4 රජයේ නිලධාරින් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අධිකරණ සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් නියමිත පරිදි ඇප තැබිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළදී මහාධිකරණ 20ක නිලධාරින් 107දෙනෙකු රු.2,471,500ක මුදලක් ඇප වශයෙන් තබා නොතිබුණි.	මුදල් රෙගුලාසි 880 අනුව හා අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 01/2011 අනුව රජයේ නිලධාරින්ගේ ඇපතැබීම යටතේ ඇපතැබීම සිදුනොකරන ලද නිලධාරින් හඳුනාගෙන කඩිනමින් ඇපමුදල් තැබීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එසේ ඇප තැබූ	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව නිලධාරින්ගේ ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

	නිලධාරින්ගේ ඇප පිටපතක් මා වෙත යොමුකරන ලෙසත්, ඇප නොතැබූ නිලධාරින්ගේ නම් කඩිනමින් මා වෙත යොමුකරන ලෙසත් මගේ අංක MOJ/E16/Common හා 2025.06.02 දිනැති ලිපිය මගින් සියලුම විනිසුරුවරුන් දැනුවත්කර ඇත. ඒ අනුව ඇපතැබීම සිදුනොකරන ලද නිලධාරින් හඳුනාගෙන මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි.	

4.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 109(1) හා (2), 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව තුළ එක් එක් වර්ෂවල දී සිදු වී ඇති අනතුරු අලාභ හානි සිදුවීම් 44කට අදාළව තවදුරටත් අයකර ගැනීමට පවතින හානි හා පාඩුවල වටිනාකම රු.3,439,925කි.	වාහන අනතුරු 08ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව විමර්ශන කටයුතු සිදුකර එම වාර්තා මේ වන විට ලැබී ඇති අතර, හානිපාඩු ලේඛනයෙන් ඉවත්කිරීමට කටයුතු සිදුකරමින් පවතින බවත්, අනෙකුත් වාහන අනතුරු වර්ෂ ගණන් පැරණි බැවින්, ගැටලු විසඳීමට පවතින ප්‍රායෝගික ගැටලු විසඳා ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	හලාවත දිසා මහේස්ත්‍රාත් විනිසුරු නිලනිවාසය ඉදිකිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන වටිනාකම රු.28,805,130ක් වන අතර, ව්‍යාපෘතිය 2020 වර්ෂයේ ආරම්භ කර 2024 වර්ෂයේ දී අවසන්කිරීමට සැලැසුම්කර තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දී තිබුණු රු.8,283,039ක අත්තිකාරම් මුදලින්	මෙම අත්තිකාරම් ඇපකරය කල් ඉකුත්වීමට පෙර දින දීර්ඝකිරීමට හෝ අයකර ගැනීමට බැංකුවට දන්වා යවා ඇත. ඒ අතරතුර ව්‍යාපෘතිය අතරමග නවතා දමා කොන්ත්‍රාත්කරු ඉවත්ව ගොස් ඇති බැවින්, එය අයකර ගැනීමට ක්‍රියාකරන ලෙස බැංකුව වෙත දැනුම් දුන්න ද ඒ සඳහා බැංකුව විසින් නීති උපදෙස්	බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇති මුදල් කඩිනමින් අයකරගත යුතු ය.

	2025 ජනවාරි මාසය වන විට රු.1,844,562ක් අයවීමට පැවතුණි. අත්තිකාරම් ඇපකරයේ වලංගු කාලය 2024 අප්‍රේල් 19 වන දිනෙන් අවසන් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය දීර්ඝකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	ලබාගැනීමට අපේක්ෂා කරන බව දන්වා එවා ඇත. ඒ අනුව බැංකුව වෙත ඇපකරය අයකර දීම සම්බන්ධව අවසන් සිහිකැඳවීම නිකුත්කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, එය අයකර නොදෙන්නේ නම් නීති අංශය මගින් ඉදිරි කටයුතු සම්බන්ධව උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිත බව දක්වා තිබුණි.	
(ආ)	2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 66දෙනෙකුගෙන් රු.8,257,938ක් ද, මියගිය නිලධාරීන් 30දෙනෙකුගෙන් රු.4,454,961ක් ද, වැඩ තහනම්කර ඇති නිලධාරීන් 71දෙනෙකුගෙන් රු.10,161,904ක් ද සහ සේවය අතහැර ගොස් සිටින නිලධාරීන් 80දෙනෙකුගෙන් රු.12,123,730ක් ද වශයෙන් එකතුව රු.34,998,533ක ණයශේෂයක් අයවිය යුතුව තිබුණි.	මෙම ණයශේෂයන් නිරවුල්කර ගැනීමට කඩිනම් පියවරගන්නා ලෙස අධිකරණ කලාප වෙත උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි.	ණයශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 7.2.5 වගන්තිය ප්‍රකාරව අවුරුදු 05කට වරක් වාහන ණය ලබාගත හැකි අතර, එසේ ලබාගැනීමේ දී කලින් ලබාගත් ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන්කර තිබිය යුතු වේ. එහෙත් කොළඹ මහාධිකරණ කලාපයේ සේවයකර වැඩ තහනම්කර තිබූ රෙජිස්ට්‍රාර්වරයෙකු මෝටර් රථ ණය හා බයිසිකල් ණය යන වර්ග දෙකම ලබා දී තිබීම නිසා ඔහුගෙන් රු.107,000ක් වූ මෝටර් රථ ණය හා රු.3,800ක් වූ බයිසිකල් ණය අයවීමට තිබූ අතර, එම ණයශේෂ වසර 10කට වැඩි කාලයක සිට අයනොවී පවතී.	රා.මු.ච. 01/2024(I) අනුව එම ණයශේෂය කපාහැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට මහභාණ්ඩාගාරය වෙත යොමුකර ඇත. ඒ අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන උපදෙස් අනුව මෙම ණයශේෂය නිරවුල්කර ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දක්වා තිබුණි.	ආයතන සංග්‍රහය ප්‍රකාරව ණයශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම සැසඳුම් ප්‍රකාශයේ කේවල ණයශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තුවේ පාලන ගිණුමේ ශේෂය අතර	අධිකරණ කලාප 26ක තොරතුරු පදනම් කරගෙන අත්තිකාරම් “බී” ගිණුම පිළියෙල කරන බවත්, ගිණුම් කලාපයන් කිහිපයක සිදු වී තිබූ ගිණුම්කරණ දෝෂයන් 2024 වර්ෂයේ දී හඳුනාගත හැකි වූ නමුත්,	පාලන ගිණුමේ ශේෂය සහ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර වෙනස නිරාකරණය කළ යුතු ය.

	රු.13,146,719ක වෙනසක් පැවතුණි.	එම දෝෂයන් සිදු වී ඇත්තේ අදාළ අධිකරණ කලාපයේ ගිණුමේ පමණක් ද නොඑසේනම් අමාත්‍යාංශ පාලන ගිණුමේ ද දෝෂ සහිතව සටහන් වී ඇති ද යන්න පිළිබඳ නිශ්චිත තොරතුරු හඳුනාගැනීමට නොහැකි වී ඇති බැවින්, එම දෝෂයන් නිවැරදිකර ගනිමින් අමාත්‍යාංශ පාලන ගිණුමේ හා කේවල ණයශේෂ වර්ගීකරණ සාරාංශය තුලනය කොට පවත්වාගැනීමට නොහැකි වී ඇති බව දක්වා තිබුණි.	
(ඉ)	2024 දෙසැම්බර් 31 දිනට මහාධිකරණ 13ක දඩලේඛනය අනුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නඩු 52කට අදාළව රු.3,883,600ක මුළු දඩමුදලක් අයකරගත යුතුව පැවතුණි.	එක් එක් මහාධිකරණවලට අදාළව මේ වන විට අයකර ගෙන ඇති දඩ මුදල් පිළිබඳ විස්තරය තවදුරටත් අයකර ගැනීමට පවතින දඩමුදල් පිළිබඳ විස්තර දක්වා තිබුණි.	දඩමුදල් නියමිත කාලසීමාව තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ.
(ඊ)	2017 සිට 2022 දක්වා වර්ෂ 05ක දී ඉදිකිරීම් ව්‍යාපෘති 03කට අදාළව කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබූ කුලී හා වැඩ අත්තිකාරම්වලින් රු.67,371,118ක ශේෂයක් තවදුරටත් අයනොවී පැවතුණි.	හලාවත විනිසුරු ද්විත්ව නිලනිවස ඉදිකිරීම් ව්‍යාපෘතිය හා වලපනේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘති වෙනුවෙන් ලබා දී තිබුණු අත්තිකාරම් මුදල් අත්තිකාරම් ඇපකරය හරහා අයකර ගැනීමට කටයුතු කරන බවත්, කැකිරාව අධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාජ ඇපකරයක් ඉදිරිපත්කර ඇති බැවින් අත්තිකාරම් මුදල් අයකර ගැනීම සම්බන්ධව නීති උපදෙස් ලබාගනිමින් පවතින බව ද, දක්වා තිබුණි.	බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු අත්තිකාරම් කඩිනමින් අයකරගත යුතු වේ.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුව අනුමත මුළු කාර්යමණ්ඩලය 4746ක් හා සත්‍ය කාර්යමණ්ඩලය 3867ක් වූ බැවින් නිලධාරින් 879ක පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණි.	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු වේ.

		නිලධාරීන් කමිටුව වෙත හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම ඉදිරිපත්කර ඇති බව දක්වා තිබුණි.	
(ආ)	දෙසැම්බර් 31 දින වන විට කාර්යාල සේවක, අධිකරණ ආරක්ෂක, සිතාසි බෙදන්නා හා ඇසිකිසි ක්‍රියාත්මක කරන්නා යන තනතුරුවලට අදාළ අනුමත කාර්යමණ්ඩලය පිළිවෙලින් 2894, 525, 819ක් හා සත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 2461, 370, 590ක් බැවින් එම තනතුරුවල ඉහළ පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණු අතර, එම ප්‍රමාණය පිළිවෙලින් 433, 155, 229ක් විය.	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරීන් කමිටුව වෙත හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම ඉදිරිපත්කර ඇති බව දක්වා තිබුණි.	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු වේ.
(ඇ)	දෙසැම්බර් 31 දින වන විට මහාධිකරණ 08ක ගණකාධිකාරීවරුන් 08දෙනෙකු වැඩ බැලීමට සේවයේ යොදවා තිබුණු අතර, එම නිලධාරීන්ගෙන් 03දෙනෙකු 2023 වර්ෂයේ සිට ද, 05දෙනෙකු 2024 වර්ෂයේ සිට ද වැඩබැලීමට පත්කර තිබුණි.	ගණකාධිකාරීවරුන්ගේ අවශ්‍යතාවය දන්වා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත අවස්ථා කිහිපයකදීම ලිපි යොමුකර ඇති නමුත්, මේ වන විටත් එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතුකර නොමැත. එසේ වුව ද, කලාප මහාධිකරණයන්හි මූල්‍ය කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු වී ඇති ගණකාධිකාරී තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් යෙදවීමට කටයුතුකර ඇති බව දක්වා තිබුණි.	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු වේ.